# 7 ශ්‍රේණිය සිංහල -2022

## 07 ඒකකය

## දෙව්දම් ඇදුරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 07. දෙව්දම් ඇදුරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි



සිංහල භාෂාවට මුල් කාලයේ බෙහෙවින් ම බලපෑවේ පාලි, සංස්කෘත භාෂා බව උගතුන්ගේ පිළිගැනීම යි. බටහිර ජාතීන්ගේ පැමිණීමෙන් පසු ක්‍රිස්තියානි ආගම මෙරට පැතිර යෑම හේතුවෙන් හීබ්රෑ, ලතින්, ග්‍රීක ආදි භාෂාවල බලපෑම සහිත අලුත් වචන සිංහල භාෂාවට එක් විය. එමෙන් ම ක්‍රමයෙන් සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයක් ද ගොඩ නැගිණි.

සිංහල භාෂාවෙන් ක්‍රිස්තු ධර්මයට අදාළ ලිපි ලේඛන මෙන් ම සිංහල සංස්කෘතිය සම්බන්ධ ලිපි ලේඛන ද සම්පාදනය කළ පූජකවරුන් අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගන්නා රදගුරු එඩ්මන්ඩ් පීරිස් හිමිපාණන් (1897-1989) පිළිබඳව මෙම පාඩම සකස් වී ඇත.

## අරුත් පැහැදිලි කිරීම

- ✓ පූජාත්වරය - පූජක භාවය
- ✓ මීසම - පදවි ප්‍රදේශයක් තුළ එක් පාලන ඒකකයක්
- ✓ මඳ නල - සෙමින් හමන සුළඟ
- ✓ අනුස්මරණය - සිහි කිරීම
- ✓ පියෙසට - ප්‍රදේශයට
- ✓ මතු නො ව - පමණක් නො ව
- ✓ වියෝව - වෙන් වීම
- ✓ ප්‍රකට - ප්‍රසිද්ධ
- ✓ ස්වර්ගස්ථ - මරණයෙන් පසු දෙව්ලොව උපත ලැබීම
- ✓ අභිනව - අලුත්
- ✓ පෙරදිග - නැගෙනහිර
- ✓ අපරදිග - බටහිර

✓ හසළ - මනා ලෙස පුරුදු පුහුණු කළ
✓ ප්‍රාඥයකු - ප්‍රඥාව ඇත්තකු
✓ භාෂා ඥානය - භාෂා දැනුම
✓ රුකුලක් - උදව්වක්
✓ අවධියේ - කාලයේ, යුගයේ
✓ ප්‍රවීණ - නිපුණ, දක්ෂ
✓ සහජීවනය - සහයෝගයෙන් ජීවත් වීම
✓ සංකලනයක් - මනා එකතුවක්
✓ සත් කාර්යයක් - යහපත් කටයුත්තක්
✓ පරිශ්‍රමයෙන් - වෙහෙස වීමෙන්
✓ අගරදගුරු - අගරදගුරු පදවියක් ලෙස නම් කරන ලද ප්‍රදේශයක ප්‍රධාන පූජකවරයා. ගෞරව නාමයකි. උදා: කොළඹ අගරදගුරුතුමා
✓ රදගුරු - රදගුරු පදවියක් ලෙස නම් කරන ලද ප්‍රදේශයක ප්‍රධාන පූජකවරයා. ගෞරව නාමයකි. උදා: හලාවත රදගුරුතුමා
✓ දෙව් සත් සල - දේව ශාස්ත්‍ර ශාලාව (සෙමනේරිය); පූජකවරුන් පුහුණු කරන අධ්‍යාපන ආයතනය
✓ ද්විතීයක අධ්‍යාපනය - 6 ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය දක්වා අධ්‍යාපනය
✓ රදගුරු අභිෂේක උත්සවය - අදාළ පුද සිරිත් සමග පදවිය සංකේතවත් කරන ශීර්ෂ පලඳනාව, රතු පාට බඳ පටිය, සැරයටිය, මුදුව ආදිය සහිතව කරන උත්සවය

## අවබෝධය

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. i. භාෂා දැනුම එතුමාට මහත් රුකුලක් වූයේ කුමක් සඳහා ද?
   ii. එතුමා විසින් සොයා ගෙන එළි දැක්වූ අප්‍රකට ග්‍රන්ථය කුමක් ද?
   iii. එතුමා තම රදගුරු ලාංඡනය ලෙස යොදා ගත්තේ කුමක් ද?

2. එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා හලාවත පදවියෙහි රදගුරුවරයා ලෙස පත් වීමේ ඇති විශේෂත්වය කුමක් ද?

3. උගතුන් අතර උගතකු වූ එතුමාගේ ජාතික මෙහෙවර පිළිබඳව ඉදිරිපත් කළ හැකි සාක්ෂි මොනවා ද?

## අවබෝධය

1.
   I. ලේඛන කාර්යයේ දී මෙන් ම පර්යේෂණ කාර්යයන්හි දී ද ක්ෂේත්‍ර ගණනාවක පැතිරී ගිය එතුමාගේ දැනුමෙහි නිම්වළලු පුළුල් වීමට ද විවිධ භාෂා හා සංස්කෘති පිළිබඳ දැනුම හේතු වී ඇත.
   II. මග සලකුණ
   III. කුරුසයක් අතින් ගත් සිංහයකු යොදා ගත්තේ ය.

2. හලාවත උපන් එතුමා හලාවත මීසමේ ප්‍රථම කිතුනු පූජකතුමා වීමත් හලාවත පදවියේ ප්‍රථම රදගුරුතුමා වීමත් මුළු ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල රදගුරුතුමා වීමත් ය.

3.
   - ✓ කිතු දහම, සාහිත්‍ය ඉතිහාසය මුල් කර ගෙන සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය, සිරිලක මරිය බැතිය, මහනුවර ගිවිසුම, ලංකා ඉතිහාසයේ මූලික ග්‍රන්ථ, පෘතුගීසි සමය හා ඕලන්ද සමය වැනි ග්‍රන්ථ රාශියක් රචනා කිරීම.
   - ✓ අතිශයින් වැදගත් මණ්ඩල හා ආයතනවල උපදේශකවරයකු හා සභිකයකු වශයෙන් කටයුතු කිරීම.
   - ✓ පුත්තලමේ මුත්තුකුමාර නිවාසය, මාවතගම, පොල්ගහවෙල, කුලියාපිටිය ආදි ප්‍රදේශවල ළමා නිවාස, ලංසිගම මහලු නිවාසය ආදිය ඉදි කිරීම.
   - ✓ මාරවිල ශාන්ත සේවියර් විදුහල වැනි ප්‍රදේශයේ එවක පැවති පාසල් වැඩි දියුණු කිරීම.

4. එතුමාගේ චරිතයෙහි ඔබ හඳුනා ගත් ආදර්ශයට ගත හැකි විශේෂ ලක්ෂණ මොනවා ද?

5. කතෝලික සංස්කෘතිය දේශීයත්වයට පත් කිරීමට එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා ගත් පියවර මොනවා ද?

4.
   - ✓ බාල වියෙහි සිට ම පොත පතට ඇලුම් කිරීම.
   - ✓ විසිහතර පැයේ ම කාලසටහනකට අනුව වැඩ කිරීම.
   - ✓ ආගමික මෙහෙවරට මුල් තැනක් දීම.

- ✓ විවේකයක් ඇති හැම විට ම හිරු දෙසට හැරෙන සූරියකාන්ත මලක් මෙන් පොත පතට ම නැඹුරු වීම.
- ✓ ආගමික සහජීවනය අගය කිරීම.
- ✓ අසරණ වූවන්ට පිහිට වීම.
- ✓ ජාති ආගම් භේදයකින් තොරව පොදු ජන හිත සුව පිණිස ඇප කැප වී කටයුතු කිරීම.

5.
- ✓ විවාහ මංගල අවස්ථාවන්හි ජයමංගල ගාථා ගායනය හා මගුල් පෝරුව කතෝලික ආගමට හා ආකල්පයන්ට ගැළපෙන අයුරින් සකස් කොට පැවැත්වීම.
- ✓ ගොක් රැන, පුන්කලස, මඟුල් බෙර, චාරිත්‍රානුකූල පොල් තෙල් පහන් දැල්වීම, උඩරට පහතරට නැටුම් ආදි සංස්කෘතික අංග කතෝලික උත්සව අවස්ථාවන්හි දී යොදා ගැනීම.
- ✓ කිතු දහම හා සිංහල සංස්කෘතිය සංකේතවත් කරමින් තම රදගුරු ලාංඡනය ලෙස කුරුසයක් අතින් ගත් සිංහයකු යොදා ගැනීම.

# ක්‍රියා පද

- කිරීමක් හෝ සිදු වීමක් හෝ විඳීමක් හෝ ගැන කියැවෙන පද ක්‍රියා පද ලෙස හඳුන්වයි.
  - ✓ ළමයා අකුරු ලියයි. (කිරීමක්)
  - ✓ අහසේ තරු බැබළෙයි. (සිදු වීමක්)
  - ✓ මම පරිසරයේ සුන්දරත්වය විඳිමි. (විඳීමක්)

- ක්‍රියා පදවල මූලික බෙදීම් දෙකක් ඇත.
  1. අවසාන ක්‍රියා
  2. අනවසාන ක්‍රියා

I. අවසාන ක්‍රියා - වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන ක්‍රියා පද අවසාන ක්‍රියා ලෙස හඳුන්වයි. උදාහරණ:-

- ✓ අක්කා මල් නෙළයි.
- ✓ ළමයි වතුරට පනිති.
- ✓ මල්ලී සඳ දෙස බලයි.
- ✓ ගොවියෝ ගොයම් කපති.
- ✓ තාත්තා පුවත්පතක් බලයි.
- ✓ ළමයා සෙල්ලම් කරයි.
- ✓ මව දරුවන්ට ඔවදන් දුන්නා ය.
- ✓ ගොවියෝ කුඹුරු කොටති.

II. අනවසාන ක්‍රියා - වාක්‍යයක ඇතුළත් වන ආඛ්‍යාතය ලෙස නොයෙදෙන ක්‍රියා අනවසාන ක්‍රියා ලෙස හැඳින්වේ. එබඳු ක්‍රියා පද වර්ග දෙකක් පිළිබඳව මේ පාඩමේ දී ඉගෙන ගනු ලැබේ.

i. මිශ්‍ර ක්‍රියා
ii. පූර්ව ක්‍රියා

- මිශ්‍ර ක්‍රියා - අවසාන ක්‍රියාව සමග සිදු වන තවත් ක්‍රියාවක් වේ නම් එය මිශ්‍ර ක්‍රියාවක් ලෙස හැඳින්වේ. උදාහරණ:-
  - ✓ අක්කා මල් නෙළමින් වට්ටියට එකතු කළා ය.
  - ✓ අක්කා මල් නෙළ නෙළා වට්ටියට එකතු කළා ය.
  - ✓ ළමයි වතුරට පනිමින් සෙල්ලම් කළහ.
  - ✓ ළමයි වතුරට පැන පැන සෙල්ලම් කළහ.
  - ✓ මල්ලී සඳ දෙස බලමින් සිනාසෙයි.
  - ✓ මල්ලී සඳ දෙස බල බලා සිනාසෙයි.
  - ✓ ගොවියෝ ගොයම් කපමින් කවි කියති.
  - ✓ ගොවියෝ ගොයම් කප කපා කවි කියති.
  - ✓ තාත්තා පුවත්පතක් බලමින් අඹගෙඩියක් කෑවේ ය.
  - ✓ තාත්තා පුවත්පතක් බල බලා අඹගෙඩියක් කෑවේ ය.
  - ✓ දැරිය ගීයක් ගයමින් නැටුවා ය.
  - ✓ දැරිය ගීයක් ගය ගයා නැටුවා ය.
  - ✓ මල්ලී ක්‍රීඩා තරඟය නරඹමින් අත්පොළසන් දුන්නේ ය.
  - ✓ මල්ලී ක්‍රීඩා තරඟය නරඹ නරඹා අත්පොළසන් දුන්නේ ය.

- පූර්ව ක්‍රියා - අවසාන ක්‍රියාවට පෙර සිදු වූ හෝ සිදු කරන ලද හෝ ක්‍රියා පූර්ව ක්‍රියා නම් වේ. උදාහරණ:-
  - ✓ අක්කා මල් නෙළා වට්ටියට එකතු කළා ය.
  - ✓ ළමයි වතුරට පැන සෙල්ලම් කළහ.
  - ✓ මල්ලී සඳ දෙස බලා සිනාසුණි.
  - ✓ ගොවියෝ ගොයම් කපා කමතට ඇදිති.
  - ✓ තාත්තා පුවත්පතක් බලා අඹගෙඩියක් කෑවේ ය.
  - ✓ අම්මා බත් උයා, දරුවන්ට කැව්වා ය.
  - ✓ තාත්තා දර කපා ගොඩ ගැසුවේ ය.
  - ✓ දැරිය ගීතය ගයා නැටුවා ය.
  - ✓ මල්ලී දත් මැද, මුව දොවා, හිස පීරුවේ ය.
  - ✓ මල්ලී ක්‍රීඩා තරඟය නරඹා අත්පොළසන් දුන්නේ ය.
  - ✓ ළමයා අකුරු ලියා සෙල්ලම් කළේ ය.
  - ✓ ගොවියෝ කුඹුරු කොටා විවේක ගත්හ.

# ගුරු අත් පොතෙන්...

1. හිස්තැනට සුදුසු පූර්ව ක්‍රියා රූපය හෝ මිශ්‍ර ක්‍රියා රූපය හෝ යොදන්න.

i. නැන්දා රෙදි ......................... (සෝදයි) වැලෙහි වැනුවා ය.
ii. ගුරුවරු අවවාද ...................... (දෙයි) සිසුන් යහමඟ යවති.
iii. මම බසයෙන් ........................... (බසියි) නිවසට ගියෙමි.
iv. අක්කා පොත ........................... (කියවයි) පාඩම පැහැදිලි කළා ය.
v. අම්මා දර ....................... (කඩයි) මිටි ............................... (බඳියි) හිස මත තබා ගත්තා ය.

2. පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා පද යොදා වාක්‍ය 05 බැගින් නිර්මාණය කරන්න.

.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................
.......................................................................................

3. හිස්තැනට සුදුසු පූර්ව ක්‍රියා රූපය හෝ මිශ්‍ර ක්‍රියා රූපය ලියන්න.

| ක්‍රියා පද | පූර්ව ක්‍රියා පදය | මිශ්‍ර ක්‍රියා පදය |
|---|---|---|
| නටයි | නටා | නටමින්/නට නට |
| හඬයි | | |
| ලියයි | | |
| කපයි | | |

# ගුරු අත් පොතෙන්... - පිළිතුරු

1. හිස්තැනට සුදුසු පූර්ව ක්‍රියා රූපය හෝ මිශ්‍ර ක්‍රියා රූපය හෝ යොදන්න.

i. නැන්දා රෙදි සෝදා (සෝදයි) වැලෙහි වැනුවා ය.
ii. ගුරුවරු අවවාද දී (දෙයි) සිසුන් යහමග යවති.
iii. මම බසයෙන් බැස (බසියි) නිවසට ගියෙමි.
iv. අක්කා පොත කියවමින් (කියවයි) පාඩම පැහැදිලි කළා ය.
v. අම්මා දර කඩා (කඩයි) මිටි බැඳ (බඳියි) හිස මත තබා ගත්තා ය.

2. පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා පද යොදා වාක්‍ය 05 බැගින් නිර්මාණය කරන්න.

- ✓ සිසුවා මවුපියන් වැඳ නිවසින් පිටව යයි.
- ✓ මව කිරි දී දරුවන් පෝෂණය කරයි.
- ✓ යාචකයා වාඩි වී කෑම කයි.
- ✓ මුවා සිංහයාට බිය වී තැතිගෙන දිව්වේ ය.
- ✓ ළමයා උදෙන් අවදි වී දත් මැද මුව සෝද ආහාර අනුභව කරයි.
- ✓ රන්කරුවා රන් පිරිසිදු කර ආභරණ සාද ඔප දමා මිලට දෙයි.
- ✓ දුටුගැමුණු රජු වෙහෙර විහාර කරවා වැව් අමුණු තනවා දැහැමි ඔවදන් ලබා රට පාලනය කළේ ය.
- ✓ ගොවියා දහඩිය වගුරුවමින් කුඹුර කොටයි.
- ✓ නළුවා ගී ගයමින් රඟපායි.
- ✓ තරුණිය ඉකිබිඳිමින් වැළපුණා ය.
- ✓ වීරසිංහ ගුරු මහතා ඇවිදිමින් පුවත්පත බලයි.
- ✓ නළුවා ගයගයා නටයි.
- ✓ වාදකයා ගී කියකියා වයයි.
- ✓ ළමයා පොත බලබලා විෂය කරුණු හදරයි.
- ✓ නිළිය ගී ගයමින් නැටුවා ය.
- ✓ දරුවා බිම පෙරළෙමින් හඬයි.
- ✓ නළුවා ගී ගයා රඟපායි.
- ✓ උපාසිකාව සුදුවතින් සැරසී තෙල්මල් ගෙන විහාරයට පා නගයි.

3. හිස්තැනට සුදුසු පූර්ව ක්‍රියා රූපය හෝ මිශ්‍ර ක්‍රියා රූපය ලියන්න.

| ක්‍රියා පද | පූර්ව ක්‍රියා පදය | මිශ්‍ර ක්‍රියා පදය |
|---|---|---|
| නටයි | නටා | නටමින්/නට නට |
| හඬයි | හඬ | හඬමින්/හඬ හඬා |
| ලියයි | ලියා | ලියමින්/ලිය ලියා |
| කපයි | කපා | කපමින්/කප කපා |

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන ඡේදයෙහි යෙදී ඇති මිශ්‍ර ක්‍රියා පද සහ පූර්ව ක්‍රියා පද පහ බැගින් සොයා ලියන්න.

කෙත් වතු පසු කොට, වන රොදක් මැදින් ඇද්දා වූ ලණු පටක් සේ කෙළින් පිහිටි පාරකට බැස්සා වූ සේනාවගේ පෙරමුණ ගමන් කරන ගැල් පැද්දෙන හඬ අසා තිත්දෙන් අවදි වූ වඳුරෝ කෑ-කෝ ගසමින් ගසින් ගසට පැන පලා යෙති. වන හිස එළිය කරමින් පියෑඹූ කණමැදිරියෝ වඳුරන් පැනීමෙන් පාත් වී උස් වන අතුවල හැපී ගිනි පුපුරු හැළෙන්නාක් මෙන් තණ කොළ වසමින් බිම වැටී, රත් පලසක වතළ මැණික් මෙන් බබළති. වඳුරන්ගේ පෙරළියෙන් බිය ගත් මුවෝ, ගෝන්නු, වල්ඌරෝ වන රොද බිඳිමින් පලා යෙති... බෙර දවුල් වැයීමක් නැතත් සේනාවෙහි ඇතැමෙක් ගී-සින්දු කියති... තවත් එකෙක් බොරු කථා ගොතා කියමින් අනායයන් සිනස්සයි...දේදුන්නෙහි සියලු පැහැ එක් කොට ගෙන හිරු රැසින් අනා කළ දේට නිගා කළ, විසිතුරු පැහැයෙන් බබළන සිනිඳු පියාපත් ඇති සමනලයෝ, වන මල් පඳුරුවලට වඩාත් ළංව අහසේ පියාඹති. ගල් බැඳ කැටයම් කරන ලද රන් කෙවෙනි පොකුරක් වැනි, හීන් වන මල් පොකුරකට පාත් වී, පියාපත් සෙමින් උස් පාත් කරමින් මල් පැණි උරන සමනලයකු දකින හූනෙක් සෙමින් බඩ ගා-ගොස් ඌ දෙසට පනියි. හූනාට අසු නො වන සමනලයා, හිරු රැස් හා මිශ්‍රව අතුරුදහන් වන්නාක් මෙන් වහා පියාඹා පලා යේ. ඈත පිහිටි වෙල් යායවල කොක්කු, කොරවක්කු, ගැල් පැද්දෙන හඬින් බියව අහසට නැඟ, දුනු දියෙන් ගිලිහුණ ඊයක වේගයෙන් ඉවත පියාඹති. මඩෙහි ලැග උන් මී හරක් නැඟී සිට දෙකන් උඩ හිඳුවා ගෙන, ගමන් ගත් සේනාව දෙස විස්මයෙන් මෙන් බලති. ඇතැම් ගවයෙක් මඩ වගුරු කලඹ කලඹා දුවයි.

රෝහිණී, මාර්ටින් වික්‍රමසිංහ

## ලිඛිත අභ්‍යාස

1.

- ✓ **මිශ්‍ර ක්‍රියා පද** - කෑ-කෝ ගසමින්, වසමින්, බිඳිමින්, කියමින්, කරමින්, කලඹ කලඹා
- ✓ **පූර්ව ක්‍රියා පද** - පසු කොට, අසා, පැන, හැපී, බැඳ, ගොස්, පියාඹා, බියව, නැඟ

ii. පහත සඳහන් ඡේදයෙහි හිස් තැන් පිරවීමට සුදුසු පූර්ව ක්‍රියා පද වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කොට ලියන්න.

"තාත්තා උදෙන් ම කුඹුරෙහි ලියදිවලට වතුර ........................ වක්කඩවල් ........................ ගෙදර ආවේ ය. කරෙහි වූ උදැල්ල බිම ........................ හිසෙහි වූ තොප්පිය අතට ........................ ළිඳ ළඟට ........................ වට පිට ........................ තොප්පිය දෙහි ගසෙහි ........................ ළිඳෙන් වතුර ........................ ඇඟ සේදුවේ ය. රෙදි ........................ වැලෙහි ........................ අම්මා ද ළිඳ ළඟට ආවා ය."

(සෝදා, තබා, බලා, බැඳ, හරවා, ගෙන, එල්ලා, වනා, ඇද, ගොස්)

iii. පහත සඳහන් ඡේදයෙහි හිස්තැන් පිරවීම සුදුසු මිශ්‍ර ක්‍රියා පද වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කොට ලියන්න.

දෙතුන් දිනක සිට තද වැසි .................... පැවතිණි. පෙරදිග සිට ආ සුළඟ වේගයෙන් හමා ගියේ ය. දිවා රෑ ඇති වූ කුණාටු නිසා බට පඳුරු 'සිරි සිරි' .................... පැවතිණි. බට පඳුරුවල මුදුන් කෙළවරවල් පොළොව සිඹින්නට විය. අහසේ ඉඩක් නැති තරමට වලාකුළු ගොඩ ගැසිණ. විටින් විට කලින් පැවතුණාට වඩා අඳුර .................... පැවතිණ. ඈත අහසේ කොහේ දෝ තැනක සුර අසුරන්ගේ මහා සංග්‍රාමයක් ඇරඹී ඇති ලෙසක් පෙනේ.

දෙවියන් එවන ගිනි ගෙන දැවෙන හෙණ සැර, ගිනි .................... ඇසි පිය හෙළන නිමේෂයකින් කාල වර්ණ සතුරු සේනාව සුනු විසුනු කර දමන නමුත් එයිනුත් විනාශ නො වූ සතුරෝ කාලවර්ණ සෙවණැලිවලින් අහසත් පොළවත් .................... සැරි සරති.

දිවා රෑ 'චිරි චිරි' හඬ නො කඩවා පැවතිණි. ගංගාවේ දිය වැඩිවෙමින් පැවතිණ. මේ විකට කොපමණ ගෙවල් දොරවල් කැඩී බිඳී ගොස් ඇද්ද? ගොඩ බිම සැම තැන ම ඇති ජලයත් ගංගාවේ ජලයත් එකට එකතු වී තිබිණි. ගව මහිෂාදීහු ගස් යට ද, බට පඳුරු යට ද ගෙම්දුල්වල ද හොඳට ම .................... සිටිති. ඇසෙන්නේ කුණාටුවේ හඬත් එක දිගට ම වහින හඬත් පමණි. අපූ පිලට අවුත් වහ වහා තෙමුණු හිසකෙස් .................... දුර්ගා සමග කථා කළේ ය.

(අඳුරු කරමින්, ඝන වෙමින්, වසිමින්, පිස දමමින්, තෙමෙමින්, පිට කරමින්, හඬ දෙමින්, දුවමින්)

මාවතේ ගීතය, චින්තා ලක්ෂ්මි සිංහාරච්චි

2. "තාත්තා උදෙන් ම කුඹුරෙහි ලියදිවලට වතුර හරවා වක්කඩවල් බැඳ ගෙදර ආවේ ය. කරෙහි වූ උදැල්ල බිම තබා හිසෙහි වූ තොප්පිය අතට ගෙන ළිඳ ළඟට ගොස් වට පිට බලා, තොප්පිය දෙහි ගසෙහි එල්ලා, ළිඳෙන් වතුර ගෙන ඇඟ සේදුවේ ය. රෙදි සෝදා වැලෙහි වනා, අම්මා ද ළිඳ ළඟට ආවා ය."

- රෝහිණී, මාර්ටින් වික්‍රමසිංහ -

3. දෙතුන් දිනක සිට තද වැසි වසිමින්, පැවතිණි. පෙරදිග සිට ආ සුළඟ වේගයෙන් හමා ගියේ ය. දිවා රෑ ඇති වූ කුණාටු නිසා බට පඳුරු 'සිරි සිරි' හඬ දෙමින් පැවතිණි. බට පඳුරුවල මුදුන් කෙළවරවල් පොළොව සිඹින්නට විය. අහසේ ඉඩක් නැති තරමට වලාකුළු ගොඩ ගැසිණ. විටින් විට කලින් පැවතුණාට වඩා අඳුර ඝන වෙමින්, පැවතිණ. ඈත අහසේ කොහේ දෝ තැනක සුර අසුරන්ගේ මහා සංග්‍රාමයක් ඇරඹී ඇති ලෙසක් පෙනේ.

දෙවියන් එවන ගිනි ගෙන දැවෙන හෙණ සැර, ගිනි පිට කරමින් ඇසි පිය හෙළන නිමේෂයකින් කාල වර්ණ සතුරු සේනාව සුනු විසුනු කර දමන නමුත් එයිනුත් විනාශ නො වූ සතුරෝ කාලවර්ණ සෙවණැලිවලින් අහසත් පොළවත් අඳුරු කරමින් සැරි සරති.

දිවා රෑ 'චිරි චිරි' හඬ නො කඩවා පැවතිණි. ගංගාවේ දිය වැඩිවෙමින් පැවතිණ. මේ ටිකට කොපමණ ගෙවල් දොරවල් කැඩී බිඳී ගොස් ඇද්ද? ගොඩ බිම සෑම තැන ම ඇති ජලයත් ගංගාවේ ජලයත් එකට එකතු වී තිබිණි. ගව මහිෂාදීහු ගස් යට ද, බට පඳුරු යට ද ගෙමිදුල්වල ද හොඳට ම තෙමෙමින් සිටිති. ඇසෙන්නේ කුණාටුවේ හඬත් එක දිගට ම වහින හඬත් පමණි. අපූ පිලට අවුත් වහ වහා තෙමුණු හිසකෙස් පිස දමමින්,දුර්ගා සමග කථා කළේ ය.

- මාවතේ ගීතය, චින්තා ලක්ෂ්මි සිංහාරච්චි -



නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය - 2020

## සිංහල භාෂාව

## 7 ශ්‍රේණිය

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**(7) ඒකකය**

## <u>දෙව්දම් ඇඳුරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි</u>

(1) පහත සඳහන් වගන්ති නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද කොටු තුළ යොදන්න.

(i) එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා ආගමික සහජීවනය ඉහළින් ම අගය කළේය. ☐

(ii) ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ හලාවත ශාන්ත මරියා ඉංග්‍රීසි පාසලෙනි. ☐

(iii) එතුමා 1945 අප්‍රේල් මස 25 දින හලාවත ආසන දෙව් මැදුරේ අභිනව රදගුරුතුමා ලෙස අභිෂේක ලැබුවේය. ☐

(iv) පාසල් නොයන දිළිඳු ළමුන් සඳහා පුත්තලමේ මුත්තුකුමාර නිවාසය ආරම්භ කළේය. ☐

(v) මුළු ශ්‍රී ලංකාවේම ප්‍රථම සිංහල රදගුරුතුමා වීමේ භාග්‍යය මෙතුමාට හිමි විය. ☐

(2) පහත දැක්වෙන වාක්‍ය වල පූර්ව ක්‍රියා පද උපුටා දක්වන්න.

(i) අප සීගිරි නැග චිත්‍ර නරඹා වැදගත් කරුණු සටහන් කරගෙන පැමිණියෙමු.

……………………………………………………………………………………..

(ii) සොරා දොර ඇර කාමරයට ගොස් බඩු රැගෙන පලා ගියේය.

……………………………………………………………………………………..

(iii) මම පොත කියවා ප්‍රශ්නවලට පිළිතුරු සැපයුවෙමි.

……………………………………………………………………………………..

(iv) අම්මා මල් නෙළා පැන් ඉස පහන් දල්වා බුදු ගුණ කියා වැන්දා ය.

……………………………………………………………………………………..

(v) ගැමිලියෝ තෙල් ගා ඉස පීරා නෙරිය තබා චීත්ත ඇඳ දැකැති ගෙන කුඹුරට බැස්සෝ ය.

……………………………………………………………………………………..

(3) පහත සඳහන් ඡේදයේ යෙදී ඇති මිශ්‍ර ක්‍රියා පද පූර්ව ක්‍රියා පද ලියන්න.

'' කෙත් වතු පසු කොට , වන රොදක් මැදින් ඇද්දා වූ ලණු පටක් සේ කෙළින් පිහිටි පාරට බැස්සා වූ සේනාවගේ පෙරමුණ ගමන් කරන ගැල් පැද්දෙන හඬ අසා නින්දෙන් අවදි වූ වඳුරෝ කෑ - කෝ ගසමින් ගසින් ගසට පැන පලා යති. වඳුරන්ගේ පෙරළියෙන් බියගත් මුවෝ , ගෝන්නු , වල්ඌරෝ වන රොද බිඳිමින් පලා යයි. මල් පොකුරකට පත් වී, පියාපත් සෙමින් උස් පාත් කරමින් මල් පැණි උරන සමනලයෙකු දකින හූනෙක් සෙමින් බඩ ගා ගොස් ඌ දෙසට පනියි. ''

(4) සුදුසු මිශ්‍ර ක්‍රියා පද යොදන්න.

(i) වැද්දෝ දඩයම් ………………………….. ජීවත් වෙති.

(ii) වඳුරෝ අත්තෙන් අත්තට ……………….. අඹ කඩා කති.

(iii) ගොවියෝ පැල් කවි …………………… වෙහෙස නිවා ගනිති.

(iv) අලි රංචුව වගා …………………… ගොවියන්ට හානි පමුණුවති.

(v) මුහුදු වෙරළට ගිය අපි රළ …………………… සතුටු වුණෙමු.

# පිළිතුරු



**Answer**

**නාලන්දා විද්‍යාලය - කොළඹ 10**
**ඒකක පරීක්ෂණය - 2020**
**සිංහල භාෂාව**
**7 ශ්‍රේණිය**

**1.**

I. √
II. √
III. x
IV. √
V. √

**2.**

I. නැග, නරඹා, සටහන් කරගෙන
II. ඇර. ගොස්, රැගෙන
III. කියවා
IV. නෙළා, ඉස, දල්වා, කියා
V. ගා, පීරා, තබා, ඇඳ, ගෙන

**3.** මිශ්‍ර ක්‍රියා පද - ගසමින්, බිදිමින්, කරමින්
පූර්ව ක්‍රියා පද- පසු කොට, අසා, පැන, පාත් වී, බඩ ගා ගොස්

**4.**

I. වැද්දෝ දඩයම් කරමින් ජීවත් වෙති.
II. වඳුරෝ අත්තෙන් අත්තට පනිමින් අඹ කඩා කති.
III. ගොවියෝ පැල් කවි කියමින් වෙහෙස නිවා ගනිති.
IV. අලි රංචුව වගා විනාශ කරමින් ගොවියන්ට හානි පමුණුවති.
V. මුහුදු වෙරළට ගිය අපි රළ පාගමින් සතුටු වුණෙමු.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තුතියි !

හසිත හෙට්ටිආරච්චි

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ